# 48 වැනි අන්තර්ජාතික මොස්කව් චිත්‍රපට උලෙළේ ජූරි සභාපතීත්වය ප්‍රසන්න විතානගේට



ලෝකයේ පැරණිතම චිත්‍රපට උලෙළක් ලෙස සැලකෙන රුසියාවේ මොස්කව් අන්තර් ජාතික චිත්‍රපට උලෙලෙ ප්‍රධාන තරඟකාරී අංශයේ ජූරි සභාපතීත්වය උලෙලෙ සංවිධායකයන් විසින් සිනමාවේදී ප්‍රසන්න විතානගේට පිරිනමා ඇත. 48 වැනි වතාවට රුසියාවේ අගනුවර වන මොස්කව් හි අප්‍රේල් මස 16 දා සිට 23 දා තෙක් පැවැත්වෙන මෙම චිත්‍රපට උලෙළෙ දී ප්‍රධාන තරඟකාරී අංශයේ හොඳම චිත්‍රපටය සහ හොඳම නළුවා සහ නිළිය සඳහා ලොව පුරා රටවලින් ඉදිරිපත් කළ චිත්‍රපට 15 ක් තරඟ වදිනු ඇත.

1975 දී පැවති 9 වැනි අන්තර් ජාතික මොස්කව් චිත්‍රපට උලෙලෙ දී නිළි රුජිත මාලිනී ෆොන්සේකා විසින් ධර්මසේන පතිරාජගේ "එයා දැන් ලොකු ළමයෙක්" චිත්‍රපටය සඳහා ඩිප්ලෝමා සහතිකයක් දිනා ගන්නා ලදි. ශ්‍රී ලාංකික සිනමා කලාකරුවෙකු මොස්කව් චිත්‍රපට උලෙළෙ දී ප්‍රධාන තරඟකාරී අංශයෙන් (වෘත්තාන්ත) සම්මානයට පත් වූ ප්‍රථම අවස්ථාව එයයි.




# සාජන්ට් පුංචිසෝම 17 වැනිදා එයි

ජනප්‍රිය චිත්‍රපට අධ්‍යක්ෂ උදයකාන්ත වර්ණසූරිය තිරරචනය ලියා අධ්‍යක්ෂණය කළ 'සාජන්ට් පුංචිසෝම' අප්‍රේල් 17 සිට එම්.ජී. අයි සිනමා මණ්ඩලයේ ප්‍රදර්ශනයක් ලෙසින් දිවයින පුරා සිනමා ශාලාවල ප්‍රදර්ශනය වේ.

චිත්‍ර ශිල්පියෙකු ලෙස කලා ක්ෂේත්‍රයට පැමිණි උදයකාන්ත 1997 දී මහමෙර උසට චිත්‍රපටය අධ්‍යක්ෂණය කරමින් සිනමාවට පැමිණි ඔහු මේ වනවිට චිත්‍රපට විසි අටක් අධ්‍යක්ෂණය කළ සම්මානනීය අධ්‍යක්ෂවරයෙකි. පසුගිය වසරේ පැවති සරසවිය සම්මාන උලෙළෙ දි හොඳම සිනමා අධ්‍යක්ෂණයට හිමි සම්මානය ඔහු විසින් දිනා ගන්නා ලදි.

මෙවර උදයකාන්ත වර්ණසූරිය විසින් අධ්‍යක්ෂණය කළ නවතම චිත්‍රපටය වන 'සාජන්ට් පුංචිසෝම' චිත්‍රපටයේ ප්‍රියන්ත සෙනෙවිරත්න, රොඩ්නි වර්ණකුල, දුලීකා මාරපන, ශ්‍රියන්ත මෙන්ඩිස්, නන්දන හෙට්ටිආරච්චි, තාරා කළුආරච්චි, මිහිරි සිරිතිලක, ආනන්ද අතුකෝරල, පියතිලක දුනුවිල ඇතුළු නළු නිළියන් රාශියක් රංගනයෙන් දායක වී ඇත. මෙහි කැමරාකරණය අයේෂ්මන්ත හෙට්ටිආරච්චි වන අතර සංස්කරණය රුවන් චාමර රණසිංහගෙති. ශබ්ද පරිපාලනය ශසීන් ගිම්හාන විසිනි. අංගරචනය වසන්ත විට්ටච්චි සමගින් නන්දන හෙට්ටිආරච්චි විසින් සිදුකර ඇත. මනෝජ් ප්‍රියන්ත කලා අධ්‍යක්ෂණයෙන් දායක වී ඇත. 'සාජන්ට් පුංචිසෝම' චිත්‍රපටයේ ගී තනු නිර්මාණය මහේෂ් දෙණිපිටිය ගෙන් වන අතර ෆැලන් ඇන්ඩ්‍රියා, ශෙනාල් නිශ්ශංක සමග ක්ලයිව් රිචඩ්ස් එක්වී ඇත. සංගීත අධ්‍යක්ෂ සංගීත වික්‍රමසිංහ පසුබිම් සංගීතය නිර්මාණය සඳහා දායක වී ඇත. ගීත රචනා කර ඇත්තේ අතුල කල්දෙමුල්ල සමගින් මාමඩුල්ලේ ගැමුණු විසිනි.

'සාජන්ට් පුංචිසෝම' චිත්‍රපටය සහය අධ්‍යක්ෂණය ඩොනල්ඩ් ජයන්ත ගෙනි. නිෂ්පාදනය උදයකාන්ත වර්ණසූරිය ගෙන් වන අතර නිෂ්පාදන කළමනාකරණයෙන් අශෝක ආරියරත්න සම්බන්ධ වී ඇත.











# සමීරගේ 'වයිෆ්' ට දින 50 ක් සපිරේ

සිනමා අධ්‍යක්ෂ සමීර නාඔටුන්න අධ්‍යක්ෂණය කළ වයිෆ් චිත්‍රපටය අති සාර්ථකව දින 50 ක් තිරගත වී ඇත. එහි සැමරුම පසුගියදා කොළඹ PVR හිදී උත්සවශ්‍රීයෙන් සමරන ලදි.

ජනප්‍රිය නළු හේමාල් රණසිංහ සමගින් උදාරි වර්ණකුලසූරිය ප්‍රධාන චරිත නිරූපණය කරන වයිෆ් චිත්‍රපටය මේ දිනවල ලෝකයේ රටවල් කිහිපයකම අති සාර්ථකව තිරගත වේ.

# වැලිකතර රජ දැක්මට අවසරයි!



ඩිජිටල් සත්කාරයෙන් ප්‍රතිස්ථාපිත ඩී. බී. නිහල්සිංහයන්ගේ "වැලිකතර" සිනමා පටය එළඹෙන 17 දින සිට19 දින දක්වා Scope Cinemas හි තිරගත කෙරේ.

දකුණු ආසියාවේම ප්‍රථම Cinemascope සිනමා සිත්තම වන "වැලිකතර" දශක ගණනාවකට පසු නැවතත් රිදී තිරයට ගෙන එනු ලබයි. සිනමා ඉතිහාසය වෙනස් කළ ඒ අපූර්ව අත්දැකීම විඳගන්න. පෙර මෙන් අදත් රසය විඳිමින් බලන්න Scope Cinemas රසික ඔබට අවස්ථාව හිමිවේ.

නිශ්ශංක විජේරත්න - නයනාංජලී